**ශ්‍රී ලංකා පදනම - 2019**
**---------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

ශ්‍රී ලංකා පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය,ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා පදනමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**-------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අපේක්ෂා කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

-----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

-----------------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 අනුව පිරිවැය රු. මිලියන 65.36 ක්වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. එසේ වුවත්, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මෙකී ඇස්තමේන්තුගත දෝෂය නිවැරිදි කිරීමට කටයුතු කර නොතිබුණු අතර මේ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවලද අනාවරණය කර නොතිබුණි. | ජීව කාලය අවසන් වී තවදුරටත් භාවිතයේ පවතින ස්ථාවර වත්කම් ඉදිරියේදී ප්‍රත්‍යාගණනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවති. | ගිණුම් ප්‍රමිත අනුව කටයුතු කල යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 හා 2018 වර්ෂයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු රු. මිලියන 2 ක අන්තර්ජාල පහසුකම් ගාස්තු හා විදුලි බිල්පත් ගාස්තු අතීතානුයෝගීව ගලපනු වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | හිඟ අන්තර්ජාල පහසුකම් ගාස්තු 2019 වර්ෂයේදි කොටස් වශයෙන් ගෙවීම් කිරීම හා 2018 වර්ෂයේ හිඟ විදුලි බිල්පත් 2019 වසරේ වියදමක් ලෙස ගිණුම් ගත කර ඇත. | නියමිත කාලපරිච්ඡේදයට අදාලව ගණුදෙනු ගිණුම් තැබිය යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට විවිධ, අධ්‍යාපන හා ව්‍යාපාර සංවර්ධන ඒකකයට ලැබිය යුතු ණය ශේෂය වූ රු. මිලියන 15.81 ක මුදල සමස්ථ ලැබිය යුතු ගිණුම්වලින් සියයට 63ක් නියෝජනය වේ. ඉන් වර්ෂ 01 ත් වර්ෂ 5 ත් අතර හිඟ ණය ශේෂය රු. මිලියන 2.92 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | නීතියමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සඳහා පාලක මණ්ඩල උපදෙස් ලබාගැනීමට දැනටමත් කටයුතු කරමින් පවතී. | සුදුසු ක්‍රමවේදයක් සකස් කර ණය ශේෂයන් අයකර ගැනිමට කටයුතු කල යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) මුදල් රෙගුලාසි 156(7) | අත්තිකාරම් ලබා දීමේදි ක්‍රමවත් ඇස්තමේන්තු සකස් කර නොතිබුණ බැවින් නිළධාරින් 12 දෙනෙකු වෙත නිකුත් කර තිබූ රු.242,000 ක් වූ අත්තිකාරම් මුදලින් | අත්තිකාරම් ලබාගන්නා සමහර නිලධාරීන් අතින් සිදුවන මෙවැනි අඩුපාඩු මග හරවා ගැනීම සඳහා අවශ්‍ය පාලන ක්‍රියා මාර්ග ගැනීමට ගිණුම් අංශය දැනටමත් කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සියයට 50 ක සිට සියයට 100ක අතර පරාසයක ඉතිරිවීම් එනම් රු.215,550 ක් නැවත ආපසු පියවා තිබුණි. | | |
| (ආ) මුදල් රෙගුලාසි 761 | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.1,725,245 ක් වූ පරිගණක උපාංග හා කාර්යාල උපකරණ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර නොතිබුණි. | ගිණුම් අංශය විසින් නඩත්තු කරනු ලබන ස්ථාවර වත්කම් ලේඛනයේ ඇති තොරතුරු නිවැරදි බව තහවුරු කරමි. | මිලදී ගන්නා සියළුම වත්කම් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.9,370,945 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.34,683,516 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.25,312,571 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන ප්‍රදාන හා අනෙකුත් ආදායම් රු.58,005,867 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කිසිදු තාක්ෂණික අධ්‍යයනයකින් තොරව මාසික කුලිය රු. 87,500ක්වූ අන්තර්ජාල සම්බන්ධතාවය, මාසික කුලිය රු. 175,000 ක්වූ පුළුල් සම්බන්ධතාවයක් වෙතට මාරුකර තිබුණි. මාස දෙකක් වැනි කෙටි කාලයකින් මෙම සම්බන්ධතාවය භාවිතා කිරීම නවතා දැමීමට කටයුතු කර තිබීම නිසා එම කාලයටද අදාලව රු. 1,242,250 ක බිල්පතක් ගෙවීමට පදනමට සිදුවී තිබුණි. | එවකට සිටි සභාපතිවරයා ඒකමතිකව තීරණය කර ගනු ලැබූ තීරණයක් නිසාවෙන් එම මුදල ගෙවීමට ආයතනයට සිදුව ඇත. | තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් පදනම් කර ගැනිමකින් පසු මෙවැනි තීරණ ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රූපවාහිනී නාලිකාවක් ආරම්භ කර පවත්වා ගෙන යාම වෙනුවෙන් 2018 හා 2019 වර්ෂවලදී එකතුව රු. මිලියන 6.9ක් වැය කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 4 ක ආදායමක් අපේක්ෂා කළද, උපයා තිබුණු ආදායම රු. 190,000ක් පමණක් විය. | 2020 වසරේ නව ආදායම් උත්පාදනය සඳහා අප අවධානය යොමු කර ඇති අතර මේ වන විට එහි සාර්ථක ප්‍රතිඵල ළඟා කර ගනිමින් පවතී. | අපේක්ෂිත පරිදි ආදායම් ඉපයීමට වගබලා ගත යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී පවත්වා තිබූ උසස් ජාතික ඩිප්ලෝමා, සහතික පත්‍ර පාඨමාලා සහ විවිධ වැඩමුළු 158ක් සඳහා ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ කථිකාචාර්යවරුන් 14 දෙනාගේ මුළු දේශන සහභාගිත්වය පැය 2923ක් වූ අතර, එම පාඨමාලා වෙනුවෙන් බාහිර සම්පත් දායකයන්ගේ දේශන සහභාගිත්වය පැය 8436ක් වී තිබුණි. ස්ථිර හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් කථිකාචාර්යවරුන්ගේ වාර්ෂික වැටුප් හා අනෙකුත් දීමනා රු. 16,407,816 ක්ද, බාහිර සම්පත් දායකයින් වෙත සමාලෝචිත වර්ෂය සඳහා ගෙවන ලද දීමනා රු. 18,402,918ක් විය. බාහිර සම්පත් දායක දේශන පැයක වටිනාකම රු.2,181ක් වන විට අභ්‍යන්තර කථිකාචාර්යවරුන්ගේ දේශන පැයක වටිනාකම රු. 5,613 ක් වී තිබුණි. | අභ්‍යන්තර කථිකාචාර්යවරුන්ගේ වැටුප් සම්බන්ධව විගණනය කිරීමේදී ආයතනයට දක්වා ඇති සමස්ථ දායකත්වය සැලකිල්ලට ගන්නා ලෙස ඉල්ලමි. | කථිකාචාර්යවරුන්ගේ කාර්යසාධන සම්බන්ධයෙන් සමාලෝචනය කළ යුතුය. |

## 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ යෝජිත චිත්‍රාගාරයක් ඉදිකිරීම වෙනුවෙන් උපදේශක සේවා ලබාගැනීමේ කොන්ත්‍රාත්තුවක් සඳහා රු.1, 049,124 ක් ගෙවා තිබුණු අතර උපදේශකයින් තෝරා ගැනීම හා සේවා සපයාගැනීම් පිළිබඳ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2, 3.3 , 3.4 හා 9.2.1 මාර්ගෝපදේශවලින් බැහැරව කටයුතු කර තිබුණි. කළමනාකාරිත්වය ගත් තිරණයකට අනුව අරමුදල් ගැටළුවක් මත මෙම චිත්‍රාගාරය ඉදිකිරීම් ව්‍යාපෘති සැලසුම්වලට පමණක් සීමා කර නවතා තැබීමෙන් දරන ලද උපදේශක ගාස්තුව නිෂ්ඵල වියදමක් වී තිබුණි. | ශ්‍රී ලංකා පදනමේ කළමනාකාරිත්වය ගත් තීරණයකට අනුව අරමුදල් ගැටළුවක් මත මෙම චිත්‍රාගාර ඉදිකිරීම් ව්‍යාපෘතිය සැලසුම් වලට පමණක් සීමා කර නවතා දමා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3.5 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පදනමට අයත් නිදහස් මාවතේ පිහිටි ඉඩමේ වටිනාකමද ඇතුළුව පිරිවැය රු.5,283,015 ක්වූ ගොඩනැගිල්ල ලිඛිත ගිවිසුම්ගත එකඟතාවයකින් තොරව බාහිර පාර්ශවයක් වෙත කිසිදු කුලියක් අය කර ගැනීමකින් තොරව ලබා දී තිබුණු අතර මෙම තත්වය විධිමත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග පාලක මණ්ඩලය විසින් ගෙන නොතිබුණි. | අප කිහිපවිටක් ම මෙම දේපල පවරාගැනීමට කටයුතු කලත් එය අත්පත්කර ගැනීමට නොහැකි වී ඇත. | බාහිර පාර්ශවයක් විසින් ප්‍රයෝජනයට ගනු ලබන දේපල පවරා ගැනීමට කටයුතු කල යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 5න් 2ක්ම පුරප්පාඩු පැවතීම පරිපාලන කටයුතු කෙරෙහි අහිතකර බලපෑම් ඇති වීමේ හැකියාවක් පැවතිය හැකි බව විගණනයේදි නිරික්ෂණය විය. | පුරප්පාඩුව පවත්නා ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු පිරවීමට යාමේදී ඇතිවන මූල්‍යමය ගැටලුකාරී තත්ත්වයන්ට පිලියමක් වශයෙන් දැනට ආයතනයේ සිටින්නාවූ ඒ හා සමාන ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් මාර්ගයෙන් අදාල කාර්යයන් සිදු කර ගැනීමට සිදුව ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |